# සංහතික සාහිත්‍යයේ සමකාලීන සමාජ භූමිකාව



**වියුඩර් වීරසිංහ**

සංහතික සාහිත්‍යය සමකාලීන සංස්කෘතියේ කොටසක් ලෙස සලකනවා පමණක් නොව එහි ස්ථානය සහ බලපෑම ක්‍රමානුකූලව පුළුල් වන්නේය. සංහතික සාහිත්‍ය සමාජයන්හි ජීවත් වන එතරම් අධ්‍යාපනයක් නැති සරල පාඨකයින් සඳහා වෙන් වී ඇති සමකාලීන සාහිත්‍ය සංස්කෘතියේ ස්වරූපයක් නියෝජනය කරන්නේය. වර්තමාන කාර්මික සහ පශ්චාත් කාර්මික සමාජවල ආධිපත්‍යයික සාහිත්‍ය ස්වරූපයක් බවට සංහතික සාහිත්‍යය පත්වී ඇත. සමකාලීන ශ්‍රී ලංකා සමාජයේ ද සාහිත්‍යකරණ ක්‍රියාවලියේ සංහතික සාහිත්‍යය කැපීපෙනෙන ප්‍රවණතාවක් බවට පත් වී තිබේ. විශේෂයෙන් පසු ගිය දශක තුන හතරක සිට ශ්‍රී ලාංකේය සමාජ ජීවිතයේ විවිධ ක්ෂේත්‍ර යටත් විජිතවාදී ලිබරල්කරණයට ලක් වීමත් සමඟම සාහිත්‍යය ක්‍රියාවලිය තුළ සංහතික සාහිත්‍යකරණ

ප්‍රවණතාව විශාල ලෙස වර්ධනය වන්නට වූ බව පෙනේ. ලෝක සාහිත්‍ය ක්‍රියාවලිය තුළ සංහතික සාහිත්‍ය පෙරටුගාමී සාහිත්‍යයට විකල්පයක් බවට පත් වෙමින් විදග්ධ සාහිත්‍යය කෙරෙහි තීරණාත්මක බලපෑමක් ද කරන ලදී.

මෙය සාහිත්‍යික සමාජයට අයත් සාහිත්‍යයක් ලෙස හඳුනා ගත හැකි අතර එය අනෙක් සාහිත්‍යික ප්‍රවණතා හෝ ප්‍රභේදවලින් මෙන්ම ම හඳුනා ගැනීමේ දී මූලික වශයෙන් එහි ගුණාත්මක අංශය කෙරෙහි පර්යේෂකයෝ සිය අවධානය යොමු කරති. මෙම සංහතික සාහිත්‍යය ඉංග්‍රීසි සාහිත්‍ය විචාරය තුළ Popular Literature, Kitch Literature, Lowbrow Art, Pulp Fiction වශයෙන් ද, ජර්මන් සාහිත්‍යික සම්ප්‍රදාය තුළ Trival Literature ලෙසද, ප්‍රංශ භාවිතය තුළ Para Literature ලෙසද, රුසියානු සහ ඇමරිකානු ව්‍යවහාරය Mass Literature ලෙස ද, හඳුනා ගනී. මීට අමතරව Boulevard Literature (මාවත් සාහිත්‍ය) සහ Formula Literature (වට්ටෝරු සාහිත්‍ය) ලෙස ද හඳුන්වනු ලබයි.

වර්තමානයේ ගෝලීය භාවිතය තුළ අප ඉහත ගෙන හැර දක්වන ලද සාහිත්‍යික ප්‍රභේදය හෝ ප්‍රවණතාව හැඳින්වීම සඳහා බහුලව යොදා ගනු ලබන්නේ Mass Literature යන භාවිතයයි.

යුරෝපය තුළ සංහතිකත්වයට පාදක වන දේශපාලන තර්කනය දෙවන ලෝක යුද්ධයෙන් පසුව ශක්තිමත් වන්නට වූ අතර, ශ්‍රී ලංකාව තුළ ඊට අදාළ දේශපාලන සමාජ පසුබිම වර්ධනය වන්නට වූයේ 50 දශකයෙන් පසුවය. එය ශ්‍රී ලංකාවට ආවේණික ඓතිහාසික, සමාජ, දේශපාලන සහ සංස්කෘතික විශේෂතා ප්‍රකට කරමින් වර්ධනය වූ අතර, 20 වන සිය වසේ 70 දශකයේ අග භාගයේ සහ 80 දශකයේ මුලභාගයේ ලිබර්ල්වාදී ප්‍රතිපත්ති හඳුන්වාදීමෙන් අනතුරුව ශ්‍රී ලාංකේය සංහතික සංස්කෘතික සහ සාහිත්‍යික ප්‍රවණතාව ගෝලීය සංහතික සංස්කෘතික-සාහිත්‍යික ප්‍රවණතාවල ආභාසය ද, ලබමින් වර්තමාන තත්ත්වය දක්වා වර්ධනය වී ඇති බව සඳහන් කළ යුතුය. මේ මොහොත වන විට ශ්‍රී ලාංකේය සමාජ-සංස්කෘතික අවකාශය තුළ සංහතික සන්නිවේදන සහ සංහතික සාහිත්‍යය ආධිපත්‍යික ප්‍රවණතාව බවට පත් වී ඇති බව ප්‍රකාශ කළ හැකිය.



ශ්‍රී ලාංකීක සමාජයෙහි සංහතික සාහිත්‍ය ප්‍රවණතාවක් සහ භාවිතයක් ලෙස වර්තමානයේදී ප්‍රචලිත ව පැවැති එය ශාස්ත්‍රීය අධ්‍යයන රාමුව තුළ න්‍යායිකකරණයකට සහ සංකල්පීයකරණයට ලක් වී නොමැත. ඒ නිසා සංහතික සංස්කෘතික ක්ෂේත්‍රය තුළ පොදු පිළිගැනීමකට ලක් නොවූ ව්‍යාකූල අරාජික සහ සාංහාරික තත්ත්වයක් දක්නට ලැබේ.

විශේෂයෙන් තවමත් අප ශාස්ත්‍රාලීය සම්ප්‍රදාය තුළ "Mass Literature" යන සංකල්පය අර්ථවත් කිරීම සඳහා ඊට යෝග්‍ය පාරිභාෂික යෙදුමක් නිශ්චිත ලෙස සොයා ගත නොහැකිය. වර්තමානයේදී ශ්‍රී ලංකාවේ Mass යන සංකල්පය වෙනුවට 'ජන', 'බහුජන', 'පොදුජන', ආදී පද රාශියක් ඒ ඒ ලේඛකයින්ගේ අභිමතය සහ ඒ ඒ අවස්ථා සන්දර්භයක් තුළ භාවිත වන බව පෙනේ. පසුගිය දශකයක පමණ කාලය තුළ මේ විෂය ක්ෂේත්‍රය පුළුල්ව සහ ගැඹුරින් අධ්‍යයනය කිරීමේදී පෙනී ගොස් ඇති මූලික කාරණයක් වූයේ ජන යන සංකල්පය Mass යන සංකල්පයෙන් අදහස් කරනු ලබන භාෂාවේදාත්මක හා සංඥාර්ථවේදී අර්ථ පමණක් නොව, දාර්ශනික, ඥානවිභාගාත්මක මෙන්ම දේශපාලනික සමාජ විද්‍යාත්මක අර්ථය ප්‍රකාශ කිරීම සඳහා යෝග්‍ය නොවන බවයි. (වීරසිංහ ටී. 2012[1]) මේ නිසා Mass යන සංකල්පය හැඳින්වීම සඳහා සිංහල භාෂාවෙන් යොදන බහුවිධ භාවිතයන් වෙනුවට සංහතික යන පාරිභාෂිකය යෙදීම වඩාත් විද්‍යාත්මක සහ ශාස්ත්‍රීය වන අතර, එමගින් අදාළ ක්ෂේත්‍රයෙහි උද්ගතව ඇති භාෂාවේදාත්මක සහ මතවාදාත්මක අවිනිශ්චිතතා සහ අපැහැදිලිතා මඟහැර ගැනීමට ද, හැකිවන බව අපගේ වැටහීමයි. මේ අනුව මේ ලිපිය තුළ Mass Literature යන ඉංග්‍රීසි පාරිභාෂිකය වෙනුවට සිංහල පාරිභාෂිකය ලෙස සංහතික යන සංකල්පය යොදා ගැනේ.

යුරෝපා සාහිත්‍ය දෙස බලන විට වර්තමානයේදී එය සම්භාව්‍ය සාහිත්‍යික ස්වරූපය අතික්‍රමණය කරමින් මහ පරිමාණික සංහතික සාහිත්‍යික ස්වරූපයක් දක්වා පරිණාමය වී ඇති බව පෙනේ. විශේෂයෙන් බටහිර - යුරෝපීය සංස්කෘතිය තුළ සාහිත්‍යයට සුවිශේෂ ස්ථානයක් සහ භූමිකාවක් හිමිවිය. සාහිත්‍ය බටහිර - යුරෝපීය ජීවිතය තුළ ප්‍රමුඛස්ථානයක් ගනු ලැබීය. 19

වන සියවස තුළ බටහිර - යුරෝපීය සමාජ ජීවිතය කෙරෙහි වූ සුවිශාල සාහිත්‍යයික භූමිකාව පසු ගිය සියවසේ සිට උත්මූලමය ලෙස වෙනස් වන්නට විය. නමුත් සාහිත්‍යික ක්ෂේත්‍රයේ ලේඛකයින් අතින් ප්‍රකාශයට පත් වන පොත් සහ සඟරා හා ඒවායේ අලෙවිය අති දැවැන්ත ප්‍රමාණයෙන් වර්ධනය වී ඇති බව පෙනේ.

නිදර්ශනයක් වශයෙන් බොහෝ ලේඛකයින්ගේ පොත්වල පිටපත් දශලක්ෂ 50 සිට දශලක්ෂ 500 දක්වා අලවිය වර්ධනය වී ඇත. මෙය සාහිත්‍යයේ සම්භාව්‍ය යුගයේදී කිසිම ආකාරයකට ළඟා විය නොහැකි යථාර්ථයක් විය. මේ දෘෂ්ටිකෝණයට අනුව සලකා බැලීමේ දී සමකාලීන සාහිත්‍යය මානව ඉතිහාසයේ අන් කවරදාකටත් වඩා වර්ධනය වී ඇති බව පෙනේ. මෙම ප්‍රමාණාත්මක නිර්ණායකවලට අනුව සාහිත්‍යයේ වර්ධනය සලකා බැලීමේ දෘෂ්ටිවාදී ආස්ථානයක් ගන්නා බවත්, එය සාහිත්‍යයේ ගුණාත්මක වර්ධනය සලකා බැලීම සඳහා නිර්ණායකයක් නොවන බවත්, අවධාරණය කළ යුතුය.

මින් අදහස් වන්නේ පෙරදී මෙන්ම වර්තමාන ලෝක සාහිත්‍යික ක්‍රියාවලිය තුළ ශ්‍රේෂ්ඨ ලේඛකයින් නූපදින්නේය යන්න නොව, සමහර විට ඔවුන් වර්තමානයේදී පෙරත් වඩා උපදිනවා විය හැකිය. නමුත්, ප්‍රශ්නය වන්නේ ඔවුන්ගේ පැවැත්මට සහ වර්ධනයට ආවශ්‍යයික කොන්දේසි අද්‍යතන සමාජය තුළ නොතිබීමයි. මේ නිසා සමකාලීන සමාජ සැකැස්මේ ස්වභාවයට, එහි ගති ලක්ෂණවලට සහ අවශ්‍යතාවලට සරිලන ආකාරයේ සංස්කෘතික සහ සාහිත්‍යික ස්වරූපයක් හැඩගැසී තිබේ.

එම සංස්කෘතික සහ සාහිත්‍යික ස්වරූපයේ සම්භවය, හැඩගැස්ම පරිණාමය එහි ස්වභාවය සහ කාර්යභාරය අධ්‍යයනය කිරීම අද්‍යතන මානව සංහතියේ සංස්කෘතික සහ සෞන්දර්යාත්මක පැවැත්ම, එහි ගතික සහ ප්‍රවණතා අවබෝධ කර ගැනීම කාලීන අවශ්‍යතාවකි.

මානව වර්ගයාගේ ඓතිහාසික සමාජ පරිණාමය සහ සබැඳි සමාජ විඥානයේ අවියෝජනීය ස්වරූපයක් වශයෙන් එහි සාහිත්‍යික ස්වරූපයේ ඓතිහාසික විකාශනය විවිධ උප ස්වරූප ඔස්සේ සිදු වී



ඇති බව පෙනේ. පුරාණෝක්තිවේදය, ජනශ්‍රැතිය, ගැමි සාහිත්‍යය, ජන සාහිත්‍යය, සම්භාව්‍ය සාහිත්‍යය, සංහතික සාහිත්‍යය, ජනප්‍රිය සාහිත්‍යය ආදී ඓතිහාසික සාහිත්‍යික ස්වරූප ඔස්සේ ගමන් කොට වර්තමානයේ මානව වර්ගයාගේ සාර්වාධිකාරී සාහිත්‍යික ස්වරූපය බවට සංහතික සාහිත්‍යය Mass Literature පත් ව ඇති බව පෙන්වා දිය යුතුය. අද එය ප්‍රාදේශීය, ජාතික, කලාපීය පරිමාණයන් ඉක්මවා ගෝලීය සාහිත්‍යික ස්වරූපය බවට පත්ව ඇත්තේ සංහතික සාහිත්‍යික ස්වරූපය බව අවධාරණය කළ යුතුය. සම්භාව්‍ය යුගයේදී සාහිත්‍යික නිර්මාණකරණය යන සංකල්පය භාවිත කළ ද, සමකාලීන ගෝලීය සාහිත්‍යික ක්‍රියාවලිය සංහතිකකරණයට ලක්වී ඇති නිසා එය තව දුරටත් සාහිත්‍යික නිර්මාණකරණයකට වඩා සාහිත්‍යික නිෂ්පාදන ක්‍රියාවලියක් ලෙස සැලකීම වඩාත් යෝග්‍ය වන්නේය. එනම් අද්‍යතන මානව වර්ගයාගේ සාහිත්‍යික නිර්මාණ ක්‍රියාවලිය සංහතික සාහිත්‍යික නිෂ්පාදන ක්‍රියාවලියක් බවට පරිවර්තනය වී ඇති බවයි.

මෙම සංහතික සාහිත්‍යයට ඓතිහාසික මූලයන් පවතින අතර, එහි පූර්ව කොන්දේසි බටහිර-යුරෝපීය සාහිත්‍ය දක්වා විහිදී යන්නේය. (Chernyak, m 2005[2]) සංහතික සාහිත්‍යය එක් අතකින් බටහිර-යුරෝපීය සාහිත්‍යයේ අනුප්‍රාප්තිකයෙකු ලෙස පෙනී සිටීමට ප්‍රයත්න දරන අතර, අනෙක් අතින් එය ඓතිහාසික වශයෙන් නව ප්‍රපංචයක් බව ද අවධාරණය කළ යුතුය. එය බටහිර-යුරෝපීය සාහිත්‍යයට ප්‍රතිවිරෝධී වනවා පමණක් ද, නොව එය විනාශ කරමින් සංහතික සාහිත්‍යය වර්ධනය වූ බව ද පෙන්වා දිය යුතුය. ඒ අනුව සමකාලීන සංහතික සාහිත්‍යයට ඊට ම ආවේණික මූලයන් පවතින බව පෙන්වා දිය යුතුය. බටහිර-යුරෝපීය සාහිත්‍යය ප්‍රබල ආධ්‍යාත්මික, ප්‍රබුද්ධමය සහ සදාචාරාත්මක ගුණයන්ගෙන් සමන්විත වූ අතර, සංහතික සාහිත්‍යයට එය අබිබවා සමාජ ජීවිතය කෙරෙහි ප්‍රබල බලපෑමක් සිදු කිරීමට හැකි වූයේ 20 වන සිය වස තුළ දීය. එහි ප්‍රබලත්වය ක්‍රමානුකූලව වර්ධනය වෙමින් දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව සංහතික සාහිත්‍යය බටහිර-යුරෝපීය සංස්කෘතික ජීවිතයේ පමණක් නොව, සමස්ත මානව සංහතියේම සංස්කෘතික සහ සාහිත්‍යික ජීවිතයේ සංයුක්ත කොටසක් බවට පත් විය.

විශේෂයෙන් පශ්චාත් දෙවන ලෝක සංග්‍රාම අවධියෙහි සමෘද්ධිකවාදී ආර්ථික මූලධර්ම මත මෙහෙය වූ සමාජ ව්‍යුහයේ වෙනස්වී, සංස්කෘතික සහ සාහිත්‍යික ක්ෂේත්‍ර තුළ අධිපතිත්ව අවිවේචනවාදී මනෝභාවික තත්ත්වයන් ආධිපත්‍යය දරන ලදී. ධනේශ්වර සංස්කෘතිය සහ සාහිත්‍යය මගින් නිෂ්පාදිත සියලු වටිනාකම් ප්‍රතික්ෂේප කරමින් සංස්කෘතික සහ සාහිත්‍යික ජීවිතය මත වූ ස්වයංශික්ෂණය සහ ස්වයංනියාමනය අහිමි කර ගත්තේය. (Cowley, J. 1976[3]) සමකාලීන සංහතික සාහිත්‍ය සමාජ යථාර්ථය පරාවර්තනය සහ ප්‍රතිනිර්මාණය කිරීම පසක දමා සංහතික සාහිත්‍ය උන්මූලමය වශයෙන් අලුත් දෙයකට මාර්ගය විවෘත කළේය. ක්‍රමානුකූලව සංහතික සාහිත්‍යය සමාජ සදාචාරය, චිත්තස්වභාවය සහ මානසික සංවිහිතිය මත සිය ආධිපත්‍යය පවත්වා ගෙන යෑමේ හැකියාව අත්පත් කර ගත්තේය. කලාව හා සාහිත්‍යය සමස්තයක් ලෙස ස්වාධීන වූ අතර, සාහිත්‍යයේ සහ කලාවේ ක්‍රියාකාරකයින් තමන් විසින්ම රස, රසඥතා හා අභිරුචීන් නිර්මාණය කරන්නට විය.

මේ අප ඉහත ගෙන හැර දක්වන ලද සංහතික සංස්කෘතිය සහ සංහතික සාහිත්‍යය පිළිබඳ බටහිර දෘෂ්ටිවාදයේ ආකල්පයේ මූලික හරය වන්නේ සංහතික සාහිත්‍යය නව සංවේදනතා සේවීමේ කාර්යයෙහි යෙදී සිටින බවයි.

නමුත් මානව වර්ගයාගේ සමාජ පරිණාම ක්‍රියාවලියේදී නව සාහිත්‍යික ප්‍රවණතාවක් වශයෙන් සංහතික සාහිත්‍යික ප්‍රපංචය ගැඹුරින් විශ්ලේෂණය කිරීම බටහිරවාදයේ දෘෂ්ටිවාදී ආකල්පය අතික්‍රමණය කරන්නේය.

ඉහත ගෙන හැර දක්වන ලද හේතු සාධකවලට වෙනත් සංහතික සාහිත්‍යය කාර්මික සහ පශ්චාත් කාර්මික සමාජ සංස්කෘතියේ මුඛ්‍ය සාහිත්‍යික ප්‍රවණතාව ලෙස වර්ධනය වීමට පාදක වූ සාධක සංකීර්ණයකි. ඇත්ත වශයෙන්ම එම සාධක සංකීර්ණය සංහතික සාහිත්‍යයේ මූලික ගතිලක්ෂණ හැඩගැස්වීමට ද තීරණාත්මකව බලපා ඇති බව පෙනේ.

පළමු කාරණය වූන්නේ මානව සංස්කෘතියේ සහ සාහිත්‍යයේ පරිමාව, සමාජය තුළ එහි තත්ත්වය සහ මිනිස් ජීවිතය තුළ එහි



භූමිකාව හා ආකල්පය වෙනස්වීමට ලක්වීමය. සංස්කෘතික ජීවිතය ප්‍රසාරණය වූ අතර, එය මානව ක්‍රියාකාරීත්වයේ සියලුම ක්ෂේත්‍ර කෙරෙහි විහිදී යමින් එහි දෛනික පාරිහාරික තත්ත්වයේ අභේද්‍යීය කොටසක් බවට පත් විය. එය කොතෙක් දුරට මානව ක්‍රියාකාරීත්වයේ ක්ෂේත්‍රවලට විහිදී ගියේ ද යත් එම ක්ෂේත්‍ර සහ සංස්කෘතිය අතර සීමා අතුරුදහන් වන්නට විය.

දෙවන කාරණය වූයේ සංස්කෘතිය සහ සාහිත්‍යය සංහතික ස්වරූපයෙන් සියලු දෙනාට ම සමීප වූ අතර, එය භාවිතය සහ පරිභෝජනය සාමාන්‍ය දෛනික කටයුත්තක් බවට පත් විය. සංස්කෘතික සහ සාහිත්‍යික අවකාශය සංහතික ස්වරූපයෙන් ප්‍රසාරණය සහ සාමාන්‍යකරණය විය. දශලක්ෂ සංඛ්‍යාත මිනිසුන් මේ සාහිත්‍යික සහ සංස්කෘතික අවකාශයට ඇතුළු වෙමින් ඒවයේ ආහාරය සහ පෝෂණය ලබමින් වර්ධනය වන්නට විය. එසේ ම මෙහි විශේෂත්වය වූයේ අතිවිශාල මිනිසුන් ප්‍රමාණයකට සංස්කෘතික සහ සාහිත්‍ය කටයුතුවල නිරතවීමට හා ඒවායේ නිර්මාපකයින් බවට පත් වීමේ, හැකියාව ලැබීමයි. (EagletonT,1996[4]) සංහතියේ, නවකතාකරණයේ, ප්‍රබන්ධකරණයේ, මූර්තිකරණයේ, නර්තනයේ, සිනමාකරණයේ, නාට්‍යකරණයේ, ගීතකරණයේ ආදී සාහිත්‍ය කලා සංස්කෘතික කටයුතුවල වැඩි වැඩියෙන් මිනිසුන් නිරතවන්නට වූ අතර, මෙතෙක් කල් සංස්කෘතිය සහ සාහිත්‍ය සමාජයෙහි අද්විතීය හා සුවිශේෂ ස්ථානයක් හිමි කර ගත් ක්ෂේත්‍රයක් ලෙස නොව, මිනිසුන්ගේ ජීවිතයේ සංස්කෘතික සහ සාහිත්‍ය ක්ෂේත්‍රය පිළිබඳව කතා කරන්නට විය.

තුන්වන කාරණය වන්නේ සංස්කෘතික සහ සාහිත්‍යික නිර්මාණ ක්ෂේත්‍රය අධිසංස්කෘතික සහ අධිසාහිත්‍යික නිෂ්පාදන ක්ෂේත්‍රයක් බවට පරිවර්තනය වීමයි. සමාජයෙහි "සාහිත්‍යික ඒකක" "සංස්කෘතික ඒකක" එසේ නොවේ නම් "සාහිත්‍යික ශෛලි" සහ "සංස්කෘතික ශෛලි" සංඛ්‍යාව ප්‍රමාණාත්මකව අතිවිශාල වීම සෘජු ලෙසම අදාළ ක්ෂේත්‍ර සංහතිකකරණයට යොමු කළේය. සෞන්දර්ය භාවිතය විශේෂ වූ තලයක සිට සාමාන්‍ය තලයකට පරිවර්තනය විය. සංකීර්ණ සාහිත්‍යික නිර්මාණ ක්‍රියාවලිය සහ සරල සාහිත්‍යික නිෂ්පාදන ක්‍රියාවලියක් බවට පත් වූ අතර, එහි නිර්මාණාත්මක භාවය

සහ අද්විතීයත්වය විශේෂණයක් බවට පත් විය. මෙය වර්තමාන ශ්‍රී ලාංකේය නවකතා, කෙටිකතා, ගීත, නාට්‍ය, චිත්‍රපට, වේදිකා නාට්‍ය ආදී කලා සාහිත්‍යික ක්ෂේත්‍රය දෙස බලන විට මැනවින් පැහැදිලි වන්නේය. ජීවිතයේ සුන්දරත්වය සහ ආනන්දනීයත්වය අධිකවත්ම සාහිත්‍යයේ සම්භාව්‍ය ස්වරූපය නැති වී ගොස් ඒ වෙනුවට එහි සංහතික ස්වරූපය බිහිවිය.

මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුත්තක් වන්නේ සංස්කෘතික-සාහිත්‍ය-කලා ක්ෂේත්‍රයේ නිෂ්පාදන සාධකවල ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වර්ධනය දශලක්ෂ සංඛ්‍යාත ජනතාවකට එම ක්ෂේත්‍රය සමඟ සම්බන්ධවීමේ හැකියාව සහ අවකාශය විවෘත කළ බවය. සංස්කෘතික-සාහිත්‍ය-කලා ක්ෂේත්‍රයේ නිෂ්පාදන බලවේගයන්ගේ වර්ධනය සහ ප්‍රසාරණය සංස්කෘතික-සාහිත්‍ය-කලා ක්ෂේත්‍රයේ නිෂ්පාදන සම්බන්ධතා වර්ධනය වීමට සහ බහුලීකරණය වීමට බලපෑවේය. එම ක්ෂේත්‍රයේ නිරන්තර පාරිභෝගිකයින් බවට ජනගහනයේ විවිධ ස්තර පත් වූ අතර, එම සංහතිකයින්ගේ ආධ්‍යාත්මික, බුද්ධිමය සහ ශික්ෂණමය තත්ත්වයන්ට අනුකූල වන පරිදි එම සංස්කෘතික සාහිත්‍යික-කලා නිර්මාණවල තත්ත්වය සකස් විය. බටහිර රටවල සංස්කෘතික-සාහිත්‍යික-කලා නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියැළී සිටින ශ්‍රමිකයින්, නිර්මාණ ශ්‍රමිකයින් කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි නියැළී සිටින ශ්‍රමිකයින්ගේ සංඛ්‍යාව අබිබවා ගොස් එය කාර්මික ක්ෂේත්‍රයෙහි නියැළී සිටින ශ්‍රමිකයින්ගේ සංඛ්‍යාවට සමාන වන්නට විය. මානව වර්ගයාගේ ඉතිහාසයේ කිසිම දාක මෙවැනි තත්ත්වයක් උදා වී තිබුණේ නැත. මෙය සංහතික සාහිත්‍යයේ නිර්මාණාත්මක ශක්‍යතාව හීන වීම කෙරෙහි ඍජු ලෙස බලපෑවේය.

සංහතික සාහිත්‍යයේ තාක්ෂණික පදනම සහ එහි නිර්මාණකරණයේ, තාක්ෂණික මාධ්‍යයන් ප්‍රමාණාත්මකව මෙන් ම ගුණාත්මකව වර්ධනය වෙමින් ඡායාරූපකරණයේ, සිනමාවේ ගුවන්විදුලියේ, රූපවාහිනියේ සහ අන්තර්ජාලයේ ව්‍යාප්තිය සහ වර්ධනය මානව සංහතියේ නිර්මාණකරණයේ උන්මූලමය විපරිවර්තනයක් ඇති කිරීමට සමත්විය. ඒවා සංහතික සංස්කෘතියේ නව ස්වරූප බවට පත් වෙමින් සමාජය තුළ නව සංවේද්‍යතාවක් හැඩගැස්සුවේය.



මීළඟට මානව සාහිත්‍යය සහ සංස්කෘතිය ව්‍යාපාරික ප්‍රාග්ධනය ආයෝජනයේ සුවිශේෂී ක්ෂේත්‍රයක් බවට පත් වූ අතර, එය ක්‍රමානුකූලව ධනේශ්වර ව්‍යාපාරයක් බවට පරිවර්තනය විය. එය ක්‍රමානුකූලව ධනේශ්වර ව්‍යාපාරයක් බවට පරිවර්තනය විය. සංහතිකයින්ගේ පාරිභෝජනය සඳහා වූ සංස්කෘතික සහ සංදර්ශන භාණ්ඩ නිෂ්පාදනය පුළුල් වී එය සංකීර්ණ ස්වරූපයක් අත්පත් කර ගත්තේය. ඉල්ලුම සහ සැපයුම සංස්කෘතික-සාහිත්‍යික-කලා නිර්මාණවල ඉරණම තීරණය කරන ප්‍රධාන සාධකයක් බව පත් විය. ආධ්‍යාත්මික සහ කලාත්මක නිර්මාණවල වටිනාකමේ නිර්ණායකය බවට ඉල්ලුම සහ සැපයුම පත්වෙමින් වෙළඳපොළ මිල මඟින් සාහිත්‍ය හා කලාත්මක නිර්මාණවල සෞන්දර්යාත්මක වටිනාකම විතැන් කළේය. (Bourdieu P, 1995[5]) නිර්මාණශීලී පෞරුෂයන්ගේ දැවැන්ත භාවය නිර්ණය කරන්නට වූයේ අදාළ සිය ක්ෂේත්‍රයට පූර්වගාමීන් එකතු කළ නිර්මාණවලට සාපේක්ෂව නොව වෙළඳ පොළ සාර්ථකත්වය මතය. සාහිත්‍යය ඇතුළු සංස්කෘතික නිර්මාණවල ගුණාත්මකභාවයේ විනිශ්චයකරුවන් බවට සංහතික මාධ්‍යකරුවෝ පත් වූහ. ඒ සඳහා ඔවුන් ගුරුකොට ගත්තේ සදාචාරයේ සෞන්දර්යයේ, ප්‍රබුද්ධත්වයේ හා මානවවාදයේ නිර්ණායක නොවන බව සඳහන් කළ යුතුය. ක්‍රමානුකූලව සාහිත්‍ය සමාජ යථාර්ථය පරාවර්තනය කිරීමේ, ප්‍රතිනිර්මාණය කිරීමේ සමාජ විඥාපනයේ නිර්මාණාත්මක ස්වරූපයක් වශයෙන් තවදුරටත් ක්‍රියා නොකොට එය ධනේශ්වර සංහතික යුගයේ දෘෂ්ටිවාදී, ප්‍රචාරණවාදී සහ තත්ත්ව සංරක්ෂණවාදී කාර්යභාරයක් ඉටු කරන්නට විය. එය විශේෂයෙන් දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ලෝක සාහිත්‍යයේ කැපීපෙනෙන ලක්ෂණයක් බවට පත් වූ බව පැහැදිලි වේ.

මේ අනුව සාහිත්‍යය සංස්කෘතිය තුළ පෙරදී ඉටු කරන ලද සාධනීය මෙහෙවර සංහතික යුගයේදී අවම වූ අතර, එහි සෞන්දර්යාත්මක සහ බුද්ධිමය මට්ටම පහතට වැටී සාහිත්‍යය සදාචාරාත්මක දෘෂ්ටිකෝණයෙන් ආධ්‍යාත්මික සහ මානසික ලෝකය දූෂ්‍යකරණයේ සහ අසංවිධිතකරණයේ මාධ්‍යයක් බවට පත් වීම අවධාරණය කළ යුතුය. එය දෘෂ්ටිවාදයේ දෘෂ්ටිකෝණයෙන් සලකා බැලීමේ දී සංහතික සාහිත්‍යයේ සමාජ භූමිකාව පෙරට වඩා ශක්තිමත් සහ ව්‍යාප්තව පවතී. වර්තමානයේදී සංහතික සාහිත්‍යය දශලක්ෂ සංඛ්‍යාත සංහතිකයින්ගේ අදහස්, හැඟීම්. ආකල්ප සහ

ඔවුන්ගේ මනෝභාවයන් පාලනය කිරීමේ ප්‍රබල මාධ්‍යයක් බවට පරිවර්තනය වී ඇත. සමකාලීන පාලක පන්තියේ අවශ්‍යතාවලට අනුකූලව යථාර්ථය ස්ථාන ගත කිරීමේ සහ අර්ථකථනය කිරීමේ දෘෂ්ටිවාදී සාහිත්‍යික ස්වරූපයක් වශයෙන් සංහතික සාහිත්‍යය ක්‍රියාත්මක වේ.

වර්තමාන සමාජය තුළ සංහතික සාහිත්‍යය ප්‍රචලිත වීමට බලපෑ මූලික හේතුවක් ලෙස සංහතික මාධ්‍ය සැලකිය හැකිය. සෙසු බොහෝ සාහිත්‍යික ප්‍රභේද සහ ප්‍රවණතා අතර, සංහතික සාහිත්‍ය සහ සංහතික මාධ්‍ය භාවිතය අතර ඇත්තේ අන්‍යෝන්‍ය කල්පනික සම්බන්ධතාවකි. කලාවේ සහ තාක්‍ෂණයේ ජයග්‍රහණ මත සමකාලීන සංහතික සංස්කෘතිය තීරණාත්මක බලපෑමක් සිදු කරනු ලබයි. විශේෂයෙන්ම සංහතික සංස්කෘතියේ සහ සංහතික සාහිත්‍යයේ සමහර ප්‍රභේද සෘජු ලෙසම 20 වන සිය වසේ සංහතික මාධ්‍ය සහ සංහතික සන්නිවේදනය සමඟ සබැඳී පවතී. පශ්චාත් දෙවන ලෝක සංග්‍රාමික යුගයේදී බටහිර සංහතික මාධ්‍ය අතිවිශාල ගුණාත්මක පිම්මක් පැන්න අතර, එය ක්‍රමානුකූලව බටහිර සමාජයේ වැදගත් ක්ෂේත්‍රයක් බවට පත් විය. (Gunew, S. 1994[6]) සංහතික මාධ්‍ය සංහතික විඥානය හැඩගැස්වීමෙහි අතිශය බලසම්පන්න මෙවලමක් බවට පත් වූවා පමණක් නොව, එය සමාජ විඥානයේ සහ සංහතික විඥානයේ සෙසු ස්වරූප වන සාහිත්‍යය, කලාව, දේශපාලනය පමණක් නොව, විද්‍යාව ආදී වඩාත් වාස්තවික ස්වරූප කෙරෙහි පවා තීරණාත්මක බලපෑමක් කළේය. තවදුරටත් සංහතික මාධ්‍ය සමාජ විඥානයේ සෙසු ස්වරූප පිළිබඳ තොරතුරු වාර්තාරණයේ සහ සම්ප්‍රේෂණයේ හුදු තත්ත්වය අතික්‍රමණය කරමින් එම ක්ෂේත්‍ර සංහතික මාධ්‍යකරණයට ලක් කළේය.

මේ අනුව සංහතික මාධ්‍ය සමාජ සාහිත්‍යික ක්‍රියාවලිය මත සිය ආධිපත්‍යය පවත්වා ගෙන යමින් සංහතික ගතිලක්‍ෂණ සාහිත්‍ය නිර්මාණවලට පමණක් නොව, සාහිත්‍යකරණයට සහ එම ක්‍රියාවලියට ද ආරෝපණය විය. මෙහිදී විශේෂයෙන් සංහතික මාධ්‍යයේ සහ සංහතික සන්නිවේදනයේ ක්‍රියාකාරීත්වය නිසා නිර්මාණය වූ සංහතික අවකාශය සංහතික කොන්දේසි පාදක කොට ගෙන නිර්මාණය වන සාහිත්‍යය සංහතිකකරණයට ලක්



කළා පමණක් නොව ඊට බොහෝ කලකට පෙර නිර්මාණ වූ සම්භාව්‍ය සාහිත්‍ය නිර්මාණ පවා සංහතිකකරණයට ලක් කළේය. තාක්‍ෂණික පුනර් නිෂ්පාදන යුගයේදී කලා නිර්මාණ නිබන්ධනය තුළ වෝල්ටර් බෙන්ජමින් පෙන්වා දුන්නේ මහා පරිමාණික ලෙස කලා නිර්මාණ පිටපත්කරණය නිසා උසස් කලා නිර්මාණ ඇසුරු කිරීම ප්‍රභූන්ට පමණක් නොව, සංහතිකයන්ට ද උදා වූ බවයි. (Benjamin, W. 1973[7]) 20වන සිය වස අවසානයේ සහ 21 වන සිය වස ආරම්භයේදී සංහතික සාහිත්‍ය ගෝලීය සමාජය තුළ වඩා සක්‍රිය ස්වරූපයක් අත්පත් කරගත්තේය. ඉහත වකවානුව ඉතිහාසයට එක් වන්නේ උසස් සාහිත්‍යයේ ආධිපත්‍යය සම්පූර්ණ ලෙස ම සංහතික සාහිත්‍යයට පරිවර්තනය වූ ඓතිහාසික සන්ධිස්ථානයක් වශයෙනි.

මෙහිදී විශේෂයන් සඳහන් කළ යුතු වන සංහතික සාහිත්‍යය ප්‍රචලිත වීමට බලපෑ තවත් සාධකයක් වන්නේ පශ්චාත් නූතනත්වය සහ පශ්චාත් නූතනවාදී දෘෂ්ටිවාදයේ නූතනවාදී විරෝධී, සම්භාව්‍යවාදී විරෝධී ප්‍රවණතාවයි. මෙහිදී සමකාලීන සාහිත්‍යික ක්‍රියාවලිය තුළ සංහතික සාහිත්‍යය සහ පශ්චාත් නූතනවාදී අදහස්වල අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයේ විශේෂතා විමර්ශනය කිරීම වැදගත් වන්නේය.

අද්‍යතන ශ්‍රී ලාංකේය සාහිත්‍යික ක්‍රියාවලිය තුළ සංහතික සාහිත්‍ය ප්‍රබල ස්ථානයක් සහ භූමිකාවක් ඉටු කරමින් එය සාහිත්‍යික ක්‍රියාවලියේ සංයුක්ත කොටසක් බවට පත් වුව ද, ඒ සම්බන්ධව අප සමාජයේ බොහෝ ශාස්ත්‍රාලීය සහ සාහිත්‍යික විචාරකයින් සහ ක්‍රියාකාරිකයින් අතර ඇත්තේ සෘණාත්මක හා නිෂේධනාත්මක ආකල්පයකි. එම ආකල්පය බොහෝ දෙනෙකු තුළ හැඩ ගැසීමට බලපා ඇත්තේ පූර්ව සංහතික සාහිත්‍යයට සාපේක්ෂව සාහිත්‍යය දෙස බැලීම සහ සංහතික සාහිත්‍යයට පාදක වූ සමාජ, ආර්ථික, තාක්ෂණික, දේශපාලන කොන්දේසි මඟ හැර යෑමය. මෙහිදී විශේෂයෙන්ම වර්තමාන මානව වර්ගයාගේ සමාජ පරිණාමයේ සුවිශේෂතා සංකීර්ණය නොතකා සමකාලීන සංහතික සාහිත්‍යික ක්‍රියාවලියේ හරය තේරුම් ගත නොහැකි බව අපගේ හැඟීමයි. මෙය සාහිත්‍යයේ පරිණාමයක් (Thinyanov, U. 1927[8]) ලෙස විග්‍රහ කළ ද, ඇත්ත වශයෙන්ම මෙය සමාජ පරිණාමය සාහිත්‍යික ක්‍රියාවලිය තුළ ප්‍රකාශ වීමකි.

ශ්‍රී ලාංකේය සාහිත්‍යයේ සහ සාහිත්‍යික විචාරයේ මූලික ක්‍රමවේදය ලෙස යථාර්ථවාදය පිළිගැනෙන නිසා සංහතික සාහිත්‍ය අධ්‍යයනය කිරීමේ නැම්යාව ඌන සංවර්ධිත මට්ටමක පවතී. එය අප රටේ සමාජ සංස්කෘතික තත්ත්වයේ සුවිශේෂතා සමඟ සම්බන්ධ බව පෙනේ. පොදුවේ සලකා බලන විට සංහතික සාහිත්‍යය පිළිබඳව සාමාන්‍ය ආකල්පය වන්නේ එය මානව පැවැත්මේ දුෂ්කරතා සහ කර්කෂ යථාර්ථය සඟවන, යටපත් කරන මාධ්‍යයක් වශයෙනි.

සංහතික සාහිත්‍යය සාහිත්‍යික ක්‍රියාවලියේ දෘෂ්ටිකෝණයට අනුව විශ්ලේෂණය කිරීමේදී ඉහත අප සංහතික සාහිත්‍යය සම්බන්ධව ගෙන හැර දක්වන ආකල්පය වඩාත් උත්කර්ෂණය වන්නේය. නූතනවාදයේ සහ සම්භාව්‍ය සාහිත්‍යයේ පරාමිතීන් තුළ සලකා බැලීමේදී මේ තත්ත්වය තවත් බරපතළ වන බව පෙනේ. මෙහිදී සිදු වන්නේ සංහතික සාහිත්‍යික සංකල්පය සාහිත්‍යවේදී සහ භාෂාවේදී සන්දර්භයක් තුළ සලකා බැලීමය. නමුත් සංහතික සාහිත්‍යික සංකල්පය සමාජ විද්‍යාත්මක සංකල්පයක් වශයෙන් සලකා බැලීමේදී එයට වඩාත් සාධාරණයක් සිදු වන බව පෙනේ. එසේම එයට විද්‍යාත්මක වූද, යථාර්ථවාදී වූද, තත්වයක් ද ලැබෙන්නේය. මෙහිදී එය ඒ හෝ මේ පයීතයේ ව්‍යුහය කෙරෙහි බලපාන්නා වූ තත්ත්වයකට වඩා අදාළ සංස්කෘතිය සංයුක්ත කරන්නා වූ පයීත පද්ධතියේ සමාජ කෘත්‍යය තුළ ස්ථානගත කිරීමකි.

සංහතික සාහිත්‍යයේ නිර්මාණාත්මකභාවය ප්‍රකාශයට පත් වන්නේ සංකීර්ණ සමාජ යථාර්ථය මායාත්මක, මනෝරාජික අධිසංවේදී, උද්වේගකර ඒකාකෘතික සුවිශේෂ වූ සමාජ මානසික පරිස්ථිතියක් තුළ ඉදිරිපත් කිරීමෙනි. මේ ආකාරයේ සමාජ මානසික තත්වයක් සහිත මිනිසුන් මානව වර්ගයාගේ ඉතිහාසයට ප්‍රවිෂ්ට වන්නේ 19 සහ 20 වන සියවස් අතරය, (Ortega Gasset, J. 1930[9]) සංහතික සංස්කෘතිය ක්‍රමානුකූලව මානව සංහතියේ ප්‍රමුඛතම සංස්කෘතිය බවට පත් වූයේ සංහතික තාක්ෂණික මාධ්‍ය මගින් මිනිසුන්හට තමන්ගේම ගති ස්වභාවයන් ශෛලීන් සම්ප්‍රේෂණය කරමින්, සන්නිවේදනය කරමින් අදාළ වර්ගයේ සංහතිකයින් දශ ලක්ෂ ගණනින් වර්ධනය කරන්නේය (Mannheim, K.1953[10]).



සංහතික සන්නිවේදන මාධ්‍යයට ආවේණික ලක්ෂණයක් වන චක්‍රියත්වය මෙන්ම ප්‍රචාලනය (Circulation) ඒ හා බැඳුණු බහුවිකිණීතනය (Best Seller) සංහතික සාහිත්‍යයට ද, එකසේ අදාළ වන්නේය. සංහතික සන්නිවේදන මාධ්‍යමය ගති ලක්ෂණ සංහතික සාහිත්‍ය ක්‍රියාවලිය තුළ ද, නිරීක්ෂණය කළ හැකි අතර, ඉන් තොරව එහි පැවැත්මක් පිළිබඳව අපට කතා කළ නොහැකිය. මෙය සංහතික සාහිත්‍ය සංස්කෘතියේ පොදු පරිභෝජනීය රටාව දෙස විමසිලිමත් වීමේදී ද, තහවුරු වන්නේය. නිදර්ශනයක් වශයෙන් සංහතික සන්නිවේදන මාධ්‍යයේ පල පරිභෝජනය ඉතා කෙටි කාලයක් තුළ සිදු වන අතර, ඒ සඳහා විශේෂ සූදානම් වීමක් ග්‍රාහකයාගෙන් ඉල්ලා සිටිනු නොලැබේ. සංහතික මාධ්‍ය පයීත පරිභෝජනය සඳහා විචාරාත්මක අවධානයක්, තියුණු විශ්ලේෂණ හැකියාවක්, නිර්මාණාත්මක චින්තන ශෛලියක්, පැහැදිලි තාර්කික ස්වරූපයක් අවශ්‍ය නොවේ. මේ ආකාරයටම සංහතික සාහිත්‍යකරණය ද, මානව සමාජ නිර්මාණකරණයේ සුවිශේෂීය ස්වරූපයක් ලෙස එහි පරිණාමයේ ඓතිහාසික දෘෂ්ටිකෝණයට යටත්ව සලකා බැලීමේදී එය වඩාත්ම සමීපතාවක් දක්වනු ලබන්නේ සාහිත්‍යයට වඩා සංහතික සන්නිවේදන මාධ්‍යකරණයේ සාහිත්‍යික අභිනතියක් ප්‍රදර්ශනය කරන භාවිතයකට බව අපගේ වැටහීමයි. සංහතික සාහිත්‍ය පයීත සංහතික මාධ්‍ය පයීත සහ සාහිත්‍ය පයීත අතර ස්ථානගත කිරීම වඩාත් යෝග්‍ය බව අපගේ හැඟීමයි.

මානව වර්ගයාගේ සමාජ පරිණාමයේ මානසික ක්ෂේත්‍රය සංයුක්ත කරන විවිධ වූ ස්වරූප අතර, දෘෂ්ටිවාදය සමාජ-දේශපාලන ප්‍රකාශනාර්ථීලේඛනවේදය (වීරසිංහ, ටී.2011[11]) සංහතික මාධ්‍යවේදය සහ සංහතික සාහිත්‍යය ආදී භාවිතයන් අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පමණක් නොව අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වයක් ද පෙන්වන බව පෙනේ. ඒ අතර, සමාජ-දේශපාලන ප්‍රකාශනාර්ථීලේඛනවේදය හා සංහතික මාධ්‍යවේදය අතර පවතිනවාට වඩා පුළුල් වූ ද, ගැඹුරු වූ ද, අන්‍යෝන්‍ය සම්බන්ධතාවක්, සමරූපීභාවයක් සංහතික සාහිත්‍යය හා සංහතික මාධ්‍යය සමඟ පවතින බව අවධාරණය කළ යුතුය.

සංහතික සාහිත්‍යයේ සහ සංහතික මාධ්‍ය පයීතව, සමරූපික හෝ ආසන්නරූපික පැවැත්ම සමාජ-මානසික සහ ආයතනික

යන්ත්‍රණ මගින් තත්ත්වාරෝපිත කරන බව පෙන්වා දිය යුතුය. මේ ආකාරයටම සම්භාව්‍ය සාහිත්‍යික සහ සංහතික සාහිත්‍යික රස, රසඥතාව, ආස්වාදනය අප ඉහත ගෙන හැර දක්වන ලද තත්ත්වාරෝපිත සංකීර්ණය මගින් සිදු වන බව අවධාරණය කළ යුතුය. විදග්ධ සහ සංහතික රසඥතාවේ පැවැත්මේ ගැටලුව සමාජයීයව තත්ත්වාරෝපිත සහ ආයතනිකව ව්‍යුහගත පදාර්ථයක් ලෙස විග්‍රහ කළ යුතුය. (Bourdieu P, 1995[5]). සමාජ ද්‍රව්‍ය සහ මානව ද්‍රව්‍ය අතර අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වය පුළුල් පර්යාලෝකනයක සිට විශ්ලේෂණය කිරීමේදී විදග්ධ සහ සංහතික රස ස්වරූපයන්ගේ පැවැත්මේ මූලධර්මීය වෙනස්කම් විද්‍යාත්මක පදනමක් මත සාධාරණීකරණය කිරීම අනිශ්චිතයකි. මෙය ඇත්ත වශයෙන්ම අපට ව්‍යුහීය කෘත්‍යවාදීය සහ සත්භාවවිචාරාත්මකව සාධනය කළ නොහැකිය. නමුත් සංහතික සාහිත්‍ය හා විදග්ධ සාහිත්‍ය ස්වරූපවල පැවැත්ම ඓතිහාසික සහ සාහිත්‍ය පන්ති දෘෂ්ටිකෝණයට අනුකූලව සාධාරණ බව පෙන්වා දිය හැකිය.

මේ අනුව විදග්ධ සාහිත්‍යය සහ සංහතික සාහිත්‍යය වශයෙන් මානව සංහතියේ කලාත්මක භාවිතයන් බෙදීම බොහෝ විට සම්මුතිකවාදී සාම්ප්‍රදායික තත්ත්වයක් ගන්නා අතර, එය ඓතිහාසික වශයෙන් ගොඩනැගී ඇති සානුකූලතා හා අභිලාෂ පද්ධති සමඟ සම්බන්ධ බව පෙනේ.

සංහතික සාහිත්‍යය මෙන්ම සංහතික සංස්කෘතිය ද බිහිවී වර්ධනය වන්නේ සාහිත්‍යයේම හෝ සංස්කෘතියේම අභ්‍යන්තර නියමයන්වලට අනුකූලව නොවේ. එය මානව සමාජයේ වෙනත් ගතික සහ ප්‍රවණතාවල ක්‍රියාකාරීත්වය පාදක කොට ගෙන වර්ධනය වන අතර, එහි බටහිරවාදී දේශපාලන භූමිකාව තීරණාත්මක වන්නේය. සංහතික සාහිත්‍යය සංහතිකයින්ගේ උවමනාවන් සහ අවශ්‍යතාවන් පිළිබඳ ප්‍රභූ පාලක පන්තියේ ආකල්ප පිළිබිඹු කරමින් ඒ අතරම සංහතික පාඨකයින්ගේ මනෝභාවික සහ සමාජයික මායාවන් උත්කර්ෂණය ද කරනු ලැබේ. ඒ අතර, වඩාත්ම ප්‍රචලිත මායාවක් වන්නේ සමාජ ස්තර අතර ප්‍රතිවිරෝධතාවන් අවම කිරීමේ හා සමතලා කිරීමේ මායාවයි. ඇත්ත වශයෙන්ම එම කාර්යය සමකාලීන ජාතික පමණක් නොව ගෝලීය සංහතික සාහිත්‍යයේ ප්‍රමුඛතම කාර්යය ලෙස දැක්විය හැකිය.



සාහිත්‍යික ක්‍රියාවලිය තුළ සංහතික සාහිත්‍යයේ සමකාලීන සමාජ භූමිකාව විමසා බලන විට එම සමස්ත ක්‍රියාවලියේ ආවශ්‍යයික ක්ෂේත්‍රයක් වන භාෂාව අමතක කළ නොහැකිය. භාෂාව සමාජ සංස්කෘතික ගතික සහ කොන්දේසි මගින් තත්ත්වාරෝපිත සංඥාමය ක්‍රියාවලියක් ඔස්සේ මානව හැඟීම් සංවේදිතා හා අදහස් හුවමාරු කරගන්නා සක්‍රිය පද්ධතියක් ලෙසය, එහි ගුණාංග සහ ගතිකවල බලපෑමෙන් සාහිත්‍යයට මෙන්ම, සංහතික සාහිත්‍යයට නිදහස්ව සිටිය නොහැකිය. මෙහිදී පෙනී යන මූලික කරුණක් වන්නේ සංහතික පාඨකයින්ගේ සරල රසඥතාව සැලකිය යුතු මට්ටමින් ඔවුන්ගේ සමාජ සංස්කෘතික සහ භාෂා සංස්කෘතික තත්ත්වය සමඟ බැඳී පවතින බවයි. ඇත්ත වශයෙන්ම භාෂාත්මක සහ සාහිත්‍යික රසඥතාව වෙන් කළ නොහැකි ලෙස සහසම්බන්ධය. මේ නිසා යම් නිශ්චිත සාහිත්‍යික පද්ධතියක භාෂාව අදාළ සමාජ සංස්කෘතික තත්ත්වයට සම්බන්ධ බව සලකා බැලීම යෝග්‍ය වන්නේය. (Easthope A, 1991[12])මේ අනුව සමකාලීන සංහතික සාහිත්‍යික පද්ධතිවල භාෂාව අදාළ සංස්කෘතික භාෂණ තත්ත්වයේ විශේෂතා පරාවර්තනය කරනවා පමණක් නොව එම තත්ත්වයට බලපාමින් අදාළ සංහතික සාහිත්‍යික පාඨකයින්ගේ සාහිත්‍යික හා භාෂාත්මක රසඥතාව ද, හැඩගස්වනු ලබන්නේය.

පසුගිය සියවසේ 70 හා 80 දශකවල සිට ලොව පුරා සිදු වූ ලිබරල්කරණයේ බලපෑම සාහිත්‍යික භාෂා ක්ෂේත්‍රයට ද, පුළුල් ලෙස බලපෑවේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් භාෂාවේ ලිබරල්කරණය, භාෂාවේ ග්‍රාම්‍යකරණය වීම සිදු වූ අතර, එය ජාතික සංස්කෘතික කේන්ද්‍රියවාදය බිඳ වැටීමට ද, සංස්කෘතියේ ප්‍රභූ කේන්ද්‍රීය ආධිපත්‍ය හා ප්‍රබුද්ධ කේන්ද්‍රීයවාදය බිඳ වැටීමට ද, මාර්ගය විවෘත කළේ මීට අමතරව සංස්කෘතික සහ භාෂා නිෂ්පාදනයේ, බහුලීකරණ නිෂ්පාදන සාධක වර්ධනය වී ව්‍යාප්ත වූ .අතර, එය සංස් සහ භාෂා ක්ෂේත්‍රයේ නව ගතික හා ප්‍රවණතා නිර්මාණය අලුත් ගුණයක් නිර්මාණය කළ අතර, එහි ප්‍රතිඵලයක් ව භාෂා සාහිත්‍යික සංස්කෘතික ක්ෂේත්‍රය අතික්‍රමණය කරමින් `සුපිරි' භාෂාමය සාහිත්‍යමය හා සංස්කෘතිකමය තත්ත්වයක් උදා කළේය. එම 'සුපිරි' භාෂාවේ සාහිත්‍යයේ සහ සංස්කෘතියේ ප්‍රමුඛතම

ලක්ෂණය වන්නේ අන් කිසිවක් නොව සංහතිකත්වයයි. මේ තත්ත්වය පශ්චාත් සාම්ප්‍රදායික සහ පශ්චාත් සම්භාව්‍ය තත්ත්වයක් වන අතර, මානව ජීවිතය තුළ සමාජය තුළ එහි භූමිකාව හා ස්ථානය වෙන ම අධ්‍යයනය කළයුතු වන්නේය. මෙම සංහතික සාහිත්‍යය පාඨකයින්ගේ සංහතිකත්වය සහ සංහතික පඨිතවල සංහතිකත්වය වෙන වෙන ම අධ්‍යයනය කරමින් අද්‍යතන සාහිත්‍යික ක්‍රියාවලිය තුළ සංහතික සාහිත්‍යයේ සමකාලීන සමාජ භූමිකාව යථාර්ථවාදීව සහ විද්‍යාත්මකව අවබෝධ කර ගැනීමට ප්‍රයත්න දැරීම කාලීන අවශ්‍යතාවකි.


පාදක සටහන්

1. වීරසිංහ ටී 2012 ජනමාධ්‍යවේදීය සමාජ විද්‍යාව, මාධ්‍ය න්‍යාය හා ක්‍රමවේදයේ විචාරාත්මක අධ්‍යයනය, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.
2. Chernyak, M. 2005 Phenomenon of Mass Literature 20th Century, ST. Petersburg university press
3. Cowley J. 1976, Adventure, Mystery and Romance: Formula stomas as Art and popular culture, Chicago.
4. Eagleton T, 1996, Literary Theory: An Introduction 2nd edition, Blackwell, Oxford
5. Bourdieu P. 1995 Artistic and Cultural capital// Culture and Society, Cambridge
6. Gunew S. 1994, Framing Marginality: Multicultural Literacy Studies, Melbourne University press melbourne.
7. Benjamin, W. 1973 The work of Art in the age of Mechanical reproduction in illuminations, trans. H. Zohn, Fontana, Glasgow
8. Thinyanov U, 1927 on Evolution of Literature, Moscow
9. Ortega, y Gasset, J 1930 The Revolt of the Masses, London: Allen and Masses,
10. Mannheim K 1953 Conservative thought, in essays on sociology and social Psychology, London, Rutledge
11. වීරසිංහ ටී 2011 මාක්ස්වාදී සහ නව මාක්ස්වාදී සංහතික මාධ්‍ය න්‍යාය, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ.
12. Easthope A, 1991 literacy into Cultural Studies, Rout Ledge, London